සැ. යු. — 2015.02.27 දින පළ වූ අංක 1,904 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,905 - 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා - 2015.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 574 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 578 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 27 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**

රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | රු. 12,210 - 10 x 130 -10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | 8 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවු 45 ට නොවැඩි විය යුතු ය. දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
3. අයදුම්කරුවන් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වැරදිකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුයි.
6. සභාවේ දැනට ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

04.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2. පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, මෙම සභාවේ හෝ දකුණු පළාතේ පළාත් සභාව හෝ රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට යටත් වනු ඇත.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අවශ්‍යතාව අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
2. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.:-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය, (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතු වේ.)
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්, (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
(v) වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015.03.30 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සභාපති, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව, නවනගරය, ලුණුගම්වෙහෙර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමේ දී හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.

එච්. ජී. අනුර නිශාන්ත,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ.......................... තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.

04. ස්ථිර ලිපිනය:——————————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

06. විවාහක/අවිවාහක බව:——————————.

07. (i) උපන් දිනය ඃ අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය:——————————.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස:

අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.

08. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.

09. ජාතිය:——————————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.

11. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වසර ගණන:——————————.

12. අධ්‍යාපන සුදුසුකම්:——————————.

13. පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම්:——————————.

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර:——————————.

15. එම පත්වීමේ ස්වභාවය, (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරුවලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

——————————.

අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

03-21

## සූරියවැව ප්‍රාදේශීය සභාව

සූරියවැව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත තාක්ෂණ සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයන්හි පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරාපත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | නගර ශාලා භාරකරු | 01 | රා. ප. චක්‍ර. 06/2006 (iv) PL1-2006A අනුව මාසික 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 - 17,600 | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්වීම (එක් වරක දී අවම වශයෙන් විෂයන් 05 ක් සමත්ව තිබිය යුතුය.) |
| 02 | යන්ත්‍ර ක්‍රියාකරු | 02 | රා. ප. චක්‍ර. 06/2006 (iv) PL2-2006A අනුව මාසික 12210 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 - 18,600 | * අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) සමත් වී තිබිය යුතුය.<br>* අදාල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N. V. Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br>* අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

*සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :-*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, දකුණු පළාත් සභාව විසින් සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට ඔබ බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිය සහතික කළ යුතු ය.
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අය විය යුතු ය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.
5. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසු අය තෝරා ගැනේ.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංරක්ෂණය කිරීමේ බලය සූරියවැව ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.
8. සේවා පළපුරුද්ද පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙළ කර, ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා 2015.03.20 දිනට පෙර සභාපති, ප්‍රාදේශීය සභාව, සූරියවැව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිත),
4. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
5. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය,
6. තනතුරට අදාළ නිපුණතා සහතිකයේ පිටපතක්.

අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ජේ. එරන්ද ජනක,<br>
සභාපති,<br>
සූරියවැව ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 16 වැනි දිනය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**.................................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
3. ස්ථිර පදිංචි ලිපිනය:——————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
5. විවාහක/අවිවාහක බව:——————————.
6. (i) උපන් දිනය:——————————.

   (ii) 2015.03.20 දිනට වයස: අවුරුදු........................ මාස........................ දින..............................:——————————.
7. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
8. ජාතිය:——————————.
9. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද, යන වග:——————————.
10. සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය:——————————.
11. අධ්‍යාපන සුදුසුකම්:——————————.
12. සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර:——————————.

    සේවය කළ තනතුර:——————————. සේවය කළ ස්ථානය :——————————. සේවය කළ කාලය:——————————.
13. වෙනත් සුදුසුකම්:——————————.
14. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේ ද?:——————————.

    තිබේ නම් ඒ පිළිබඳ විස්තර:——————————.

මෙම අයදුම්පත්‍රය මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වරදකරු වී නොමැති බව ද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

——————————,<br>
අයදුම්කරුගේ අත්සන.

2015 පෙබරවාරි මස 16 වැනි දින,

03-191

# පළාත් පාලන නිවේදන

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

දියුණුකළ ප්‍රදේශ වශයෙන් නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වැනි වගන්තිය ප්‍රකාර මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෙසෙල්හේනාව මංසන්ධියේ සිට 3/15 දරන බෝක්කුව දක්වා (කළුතර - යාල ප්‍රධාන මාර්ගයේ) මධ්‍ය රේඛාවේ සිට එක් පැත්තකට මීටර් 50 ක් බැගින් වූ ප්‍රදේශ හා බැල්ලපිටිය මංසන්ධියේ සිට නාරගල පාලම දක්වා (හොරණ - කලවැල්ලාව ප්‍රධාන මාර්ගය) මධ්‍ය රේඛාවේ සිට එක් පැත්තකට මීටර් 50 බැගින් වූ දෙපස ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයන් වශයෙන් බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ඇති බවත්, ඒ අනුව මෙම ප්‍රදේශ දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

පුෂ්පජිත් සීලවික්‍රම,<br>සභාපති,<br>මදුරාවල ප්‍රාදේශීය සභාව.

03-149

---

**අතුරලිය ප්‍රාදේශීය සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (i) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (i) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල ;

(i) සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(ii) සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලටම අදාල පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(iii) කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xvii) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xviii) සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxi) වාහන නතර කිරීම හා වාහන හැසරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xx) මාර්ග වලට අලාභහානි කිරීම හා මාර්ග වල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xv) ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxvi) ප්‍රජා ශාලාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

පිළිබඳ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උපවගන්තිය යටතේ අතුරලිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඩබ්. ජී. නිහාල් ද සිල්වා මෙයින් යෝජනා කරයි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ජේ. රණතුංග මහතා විසින් ස්ථිර කරනු ලදුව 2014 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 09-1- i යටතේ ඒකමතිකව සහා සම්මත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අතුරලිය ප්‍රාදේශීය සභාව විසින් 2014 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී ඉහත උපලේඛනයේ සඳහන් අංක 09 -1 - i දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. නිහාල් ද සිල්වා,<br>සභාපති,<br>අතුරලිය ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 24 වැනි දින,

03-92

---

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගනු ලැබූ බවට ප්‍රකාශයට පත් කිරීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව විසින් 2014 ජනවාරි මස 30 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් වර්ණකුලසූරිය,<br>සභාපති,<br>සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 10 වැනි දින,<br>සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013 ජුනි 28 අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා/සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 1A සිට 80A අංක දක්වා වූ කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

03-192

## ඇල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් 2014.09.29 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත්; ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා, එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් 03 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තුළ පිහිටි මාර්ගවල විස්තරය**

| *මාර්ග විස්තරය* | *දිග (කි. මී.)* | *පළල (අඩි)* |
|---|---|---|
| 1. බදුල්ල පාර - ඉලුක්ගොඩවත්ත | 2 | 8 |
| 2. කුඹල්වෙල - කොට්ටගස්වත්ත පාර | 1.5 | 9 |
| 3. බදුල්ල පාර - කුඹල්වෙල - දඹගොල්ල පාර | 3 | 10 |
| 4. මිල්ලගම - බැද්දේඅරාව පාර | 2.5 | 10 |
| 5. පියරප්පන්දෝව වෙල්සි ෆැක්ට්‍රිය පාර | 2.5 | 9 |
| 6. පියරප්පන්දෝව වතුගොවැල්ල පාර | 1/2 | 8 |
| 7. බදුල්ල බණ්ඩාරවෙල පාර දෙහිගොල්ල | 1 | 9 |
| 8. යායවත්ත - ගෙදරඅරාව | 1/2 | 8 |
| 9. හීල්ඔය සුමංගල මාවත | 1/2 | 8 |
| 10. දඹඅතුගොඩ පාර කිතල් ඇල්ල - හීල්ඔය | 1 | 9 |
| 11. කිතල්ඇල්ල ගුරුගල්මණ්ඩිය පාර | 1/2 | 9 |
| 12. කිතල්ඇල්ල - අඟුරුකොටුව පාර | 1/2 | 8 |
| 13. ඉඩමේ ගම කොස්වත්ත පාර | 1 | 9 |
| 14. ඉඩමේ ගම - වදඅඹගහ අසල | 1/2 | 9 |
| 15. ගොටුවෙල යහල්ලේ කුඹුර | 1/2 | 10 |
| 16. තිබ්බටුගොඩ පාර | 1/2 | 9 |
| 17. දෙමෝදර ක්‍රීඩාපිටිය - නාවුල්ල | 1/2 | 8 |
| 18. ගල්ටැංහේන - අඹගස්තැන්න | 1/2 | 9 |
| 19. සවුදම් වත්ත - නාවෙල ගම විහාරස්ථානය | 2 | 10 |
| 20. බැද්දේවෙල - පුපුල | 3 | 10 |
| 21. වැල්ලවාය පාර - ගොන්නින ගම | 1 | 9 |
| 22. කරඳගොල්ල - පහළඇල්ල | 1 1/2 | 10 |
| 23. හල්පේ - දිඹුල්ගස්තැන්න | 2 | 10 |

03-139

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥා පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ එළහරක් මස් වෙළෙඳාම සඳහා කඩයක් පවත්වාගෙන යාම පිණිස 2015.01.01 වැනි දින සිට 2015.12.31 වැනි දින දක්වා වූ කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම් කුමන කරුණක් නිසාද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරිය) 7 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2014 දෙසැම්බර් මස 30 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *මස් වෙළෙඳාම් කරනු ලබන ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එස්. එච්. එම්. සිද්ධික් | ඕවිට, ජයසුන්දර, නාවලපිටිය, (ඕවිට ජයසුන්දර , නාවලපිටිය, මිනින්දෝරු ඥානප්‍රගාසම් මහතා සකස් කළ සැළසුම් අංක 8659, 8 බී/3 ස්ථානය) | හරක් මස් වෙළෙඳාම |

03-190

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| මාර්තු | 2015.03.06 | සිකුරාදා | 2015.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.13 | සිකුරාදා | 2015.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.20 | සිකුරාදා | 2015.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.27 | සිකුරාදා | 2015.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2015.04.02 | බ්‍රහස්පතින්දා | 2015.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.10 | සිකුරාදා | 2015.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.17 | සිකුරාදා | 2015.04.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.04.24 | සිකුරාදා | 2015.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.30 | බ්‍රහස්පතින්දා | 2015.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2014.05.08 | සිකුරාදා | 2014.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.15 | සිකුරාදා | 2014.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.22 | සිකුරාදා | 2014.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.29 | සිකුරාදා | 2014.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.